# 06 ශ්‍රේණිය – සිංහල

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු 01 වාරය 2022



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

(විවිධ පළාත්, කලාප සහ පාසල් මගින් පළමුවන වාරය සඳහා නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 05ක් සහ ලැබී ඇති පිළිතුරු පත්‍ර අන්තර්ගතය.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

I පත්‍රය **Amal International School**

- පළමු කොටසෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදවලට වඩාත් සමීප අර්ථ දෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. **කඩිසර** ළමයා ගුරුවරුන්ගේ ඇගයීමට ලක් වේ.
(1) දඟ (2) අලස (3) ක්‍රියාශීලි (4) නපුරු

02. නරියා ඉබ්බාට **අඬා පාලා** කතා කළේය.
(1) හෙමින් (2) ආදරයෙන් (3) කරුණාවෙන් (4) හඬ නගා

- සිංහල අක්ෂර මාලාව ඇසුරෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

03. සිංහල අක්ෂර මාලාවේ මුළු අක්ෂර ගණන
(1) 18 (2) 42 (3) 60 (4) 62

04. සිංහල අක්සර මාලාවේ **ස්වර අක්ෂර** ගණන
(1) 18 (2) 42 (3) 60 (4) 62

05. පහත දී ඇති පිල්ලම තෝරන්න.
පාපිල්ලම
(1) ි (2) ා (3) ු (4) ෙ

06. හල් කළ නොහැකි ව්‍යඤ්ජන අක්ෂරය තෝරන්න.
(1) ම (2) (අ)ං (3) ල (4) ක

07. ඒක වචන පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) අම්මලා, තාත්තලා, අක්කලා, අයියා
(2) අම්මා, පුටුව, පොත්, පැන්සල
(3) ගස්, දරුවා, මල්, පහන්
(4) පාර, මල, පොත, පෑන

08. උත්තම පුරුෂ ඒක වචන නාම පදය තෝරන්න.
(1) මම (2) අපි (3) නුඹ (4) ඔහු

- පහත සඳහන් පදවලට **සමාන පද** තෝරා යටින් ඉරක් අඳින්න.

09. අම්මා
(1) භූමි (2) රුක් (3) මව (4) පියා

10. අහස
(1) තරු (2) මිහිකත (3) ගුවන (4) පවන

- පහත සඳහන් පද සඳහා **විරුද්ධ පද** තෝරා ඉරක් අඳින්න.

11. දක්ෂ
    (1) කඩිසර (2) අදක්ෂ (3) කම්මැලි (4) ලස්සන

12. දුර්වල
    (1) ශක්තිමත් (2) නිර්භය (3) ක්‍රියාශීලි (4) උත්තම

පහත සඳහන් විරාම ලකෂණ නම් කරන්න.

13. " , " මෙම විරාම ලක්ෂණය නම් කරන්න.
    (1) තිත (2) ප්‍රශ්නාර්ථ ලකුණ
    (3) විෂ්මයාදී ලකුණ (4) කොමාව

14. " ! " මෙම විරාම ලක්ෂණය නම් කරන්න.
    (1) තිත (2) ප්‍රශ්නාර්ථ ලකුණ
    (3) විෂ්මයාදී ලකුණ (4) කොමාව

15. පහත පද අතුරින් **අනුක්ත** නාම පදය තෝරන්න.
    (1) මා (2) ඔවුහු (3) කුරුල්ලෝ (4) තොපි

16. පහත පද අතුරෙන් **උක්ත** නාම පදය තෝරන්න.
    (1) බල්ලෙකු (2) ඔවුන් (3) ළමයින් (4) අපි

17. වැදි ජනයා පිළිබඳ ග්‍රන්ථ ලියූ කතුවරයෙකි.
    (1) මාර්ටින් වික්‍රමසිංහ (2) පී.බී. මීගස්කුඹුර
    (3) ජේ.බී. දිසානායක (4) එදිරිවීර සරත්චන්ද්‍ර

- 18 - 20 ප්‍රශ්නවල වාක්‍ය සඳහා සුදුසු පදය තෝරන්න.

18. .......................... ක්‍රීඩා පිටියේ සෙල්ලම් කළෙමු.
    (1) මා (2) මම (3) අප (4) අපි

19. ගැමියෝ ජනකවි නිර්මාණය ..............................
    (1) කරයි (2) කෙරුවේය (3) කරන්නේය (4) කෙරුවෝය

20. කුරුල්ලෝ අහසේ පියාසර ............................
    (1) කරති (2) කරයි (3) කරන්නේය (4) කෙරුවේය

**(ලකුණු 2 × 20 = 40)**

## II පත්‍රය

- 01 හා 02 ප්‍රශ්න අනිවාර්යය වේ. 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. ඔබ විසින් පන්ති කාමරයේ දී සකස් කළ පොත් පිංච ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ විසින් පන්ති කාමරයේ දී සකස් කළ පොතට යෙදූ නම කුමක්ද? (ල.02)

(ii) එම පොත සකස් කිරීමේදී ඔබට පැවරුණු කාර්යය කුමක්ද? (ල.02)

(iii) එම පොත සෑදීමට තොරතුරු ලබාගත් මූලාශ්‍ර 02 ක් ලියන්න. (ල.04)

(iv) එම පොත් පිංච සෑදීමට යොදා ගත් අමුද්‍රව්‍ය 02 ක් ලියන්න. (ල.04)

(v) එම පොත සෑදීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන 02 ක් ලියන්න. (ල.04)

**(මුළු ලකුණු 16)**

02. පහත මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 125 කට නොඅඩු රචනයක් ලියන්න.

(i) මගේ මව්බිම

(ii) මා ගිය විනෝද චාරිකාවක්

(iii) පරිසරය රැක ගනිමු

(iv) වැඩිහිටියන්ට සලකමු **(ලකුණු 14)**

03. ඔබගේ මිතුරෙකුගේ උපන් දිනය සඳහා යැවීමට සුදුසු සුබ පැතුම් පතක් සකස් කරන්න.

**(ලකුණු 10)**

04. පහත ප්‍රකාශ කවුරුන් විසින් කා හට කරන ලද්දේ දැයි ලියන්න.

(i) "ඔය දෙන්නා නම් පින්වත් ඇත්තෝ"

කවුරුන් විසින් ද? ……………………..

කා හටද? ……………………..

(ii) "හා, හා මම එහෙමත් කරනවද?"

කවුරුන් විසින් ද? ……………………..

කා හටද? ……………………..

(iii) "මේක එක කටකටත් මදිනේ"

කවුරුන් විසින් ද? ……………………..

කා හටද? ……………………..

(iv) "අපූරු අමුතු දෙයක් හොයා ගත්තොත් නුඹට මුළු කැලේ පුරාම කියව කියවා ඇවිදින හැකී.

කවුරුන් විසින් ද? ……………………..

කා හටද? ……………………..

(v) “ගොහින් බලපල්ලා මගේ වී ගොඩ”

කවුරුන් විසින් ද? …………………….

කා හටද? …………………….

**(ලකුණු 2 × 5 = 10)**

05. පහත සඳහන් පාඨ උපුටා ගත් ග්‍රන්ථ සහ එම ග්‍රන්ථවල කතුවරු නම් කරන්න.

(i) “එකමත් එක ගමක ලොකු විලක් තිබුණා”

ග්‍රන්ථය : …………………….

කතුවරයා : …………………….

(ii) “වනයට ගිය කොල්ලෝ ටික වේලාවකින්ම ආපසු පැමිණියෝය.”

ග්‍රන්ථය : …………………….

කතුවරයා : …………………….

(iii) “...... එහි වූ රුකක අමුතු සතෙකු වාසය කරන්නේ යැයි රාවයක් පැතිර ගියේය”

ග්‍රන්ථය : …………………….

කතුවරයා : …………………….

(iv) “රූකඩ කපන්නාගේ ඉස්තෝප්පුව කෝපි කඩයකි”

ග්‍රන්ථය : …………………….

කතුවරයා : …………………….

(v) “එකමත් එක රටක පවුලක සහෝදරයෝ හත් දෙනෙක් සිටියෝය.“

ග්‍රන්ථය : …………………….

කතුවරයා : …………………….

**(ලකුණු 2 × 5 = 10)**

06. “....බිබිලේ මඩකලපුව අතර පැරණි වැදි රට වශයෙන් හැඳින්වුණ කොටසේ වර්ග කීපයක වැද්දන්ගෙන් මිශ්‍රව දැනට ඉතිරිව සිටින ටික දෙනා වූ මේ වැද්දෝ මෙතෙක් විසූ ගල් ගෙය හැර මගට බැස්සෝය. ආරක්ෂා විරහිත නිර්භීත දක්ෂ මේ කුඩා පිරිසේ එක ම ආරක්ෂක ආයුධය වූයේ ඔවුන්ගේ ම දෛවය යි.”

(i) මෙම ඡේදයෙන් කියැවෙන්නේ කවුරුන් පිළිබඳව ද?

(ii) පැරණි වැදි රට වශයෙන් හැඳින් වූ කොටස කුමක්ද ?

(iii) ඔවුන් විසූයේ කුමන ස්ථානයකද?

(iv) ඔවුන්ගේ එකම ආරක්ෂක ආයුධය වූයේ කුමක්ද?

(v) පහත වචන සඳහා සමාන පද ලියන්න.

(1) කුඩා- (2) මඟ -

**(ලකුණු 2 × 5 = 10)**

07. කෑමට කෑදරකම් නොකරන්නේ
තව මට කියමින් කෑ නොගසන්නේ
තරහට කෑමක් විසි නොකරන්නේ
එළිපිට හිටගෙන කෑම නොකන්නේ

ඇඟ වැසුවෙන් නිසි ඇඳුම් අඳින්නේ
බඩ නෙරුවෙන් රෙදි ඇඳ නොමගන්නේ
හිස වැසුමෙන් නිසි තැන නොවදින්නේ
සුදුසු තැනින් නිසි ලෙස පලයන්නේ

(i) මෙම කවි වලින් කියැවෙන්නේ කුමක් ගැනද?
(ii) මෙහි සඳහන් නොකළ යුතු ක්‍රියාවන් දෙකක් ලියන්න.
(iii) ඇඟ වැසීම සඳහා ඇඳිය යුත්තේ මොනවාද?
(iv) “කෑදරකම” යන්නෙන් හඳුන්වන්නේ මොනවාද?
(v) පහත පද සඳහා සමාන පද කවිවලින් තෝරා ලියන්න.
(1) ආහාර - (2) වස්ත්‍ර -

**(ලකුණු 2 × 5 = 10)**

Set A
1

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **06 ශ්‍රේණිය**
**இரண்டாம் தவணைப் பரீட்சை 2018** **தரம் 06**
**First Term Test 2017** **Grade 06**

**සිංහල භාෂාව හා සාහිත්‍යය 1**
**Sinhala Language And Literature 1**

**පැය දෙකයි**
*Two Hour*

## I කොටස

*ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. හිස් තැනට ගැළපෙන අනුක්ත පදය වරහන් තුළින් තෝරාලියන්න.

i. පියාණෝ ............................................. ට (දරුවන් / දරුවෝ) අවවාද දෙති.

ii. බල්ලෝ ................................ (හාවෝ / හාවුන්) පසුපස පැන්නුවෝ ය.

iii. පූසා .............................. (කෘමීහු / කෘමීන්) ආහාරයට ගත්තේ ය.

iv. හෙදිය ................................... (රෝගීහු /රෝගීන්) සුවපත් කළා ය.

v. මව්වරු ................................ (දරුවන් / දරුවෝ) සුරතල් කළෝ ය.

(ලකුණු 05 )

02. පහත දැක්වෙන පදවල අර්ථය ලියන්න.

i. අඩ පාලා -

ii. බුරුල් -

iii. තනන්නේ -

iv. ඩැහැගත්තා -

v. කොට්ට වෙලා -

(ලකුණු 05 )

03. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය යටින් ඉරක් අඳින්න.

i. ආකර්ෂනීය , ආකර්ෂණීය, ආකර්සනීය

ii. පිළිබඳව, පිලිබඳව, පිළිබදව

iii. දර්ෂණය, දර්ෂනය, දර්ශනය

iv. හෘදයාංගම, හෘර්දයාංගම, හෘදයංගම

v. පුස්තකාලය, පුස්ථකාලය, පුස්තකාළය

(ලකුණු 05)

04. පහත පදවලට විරුද්ධ පද ලියන්න.

i. ප්‍රීතිය

ii. උණුසුම

iii. නිශ්චල

iv. දිළිඳු

v. යහපත් (ලකුණු 05 )

05. මුලින් දී ඇති පිල්ලම් යොදා වචන දෙක බැලින් ලියන්න.

i. ගයනුකිතත්ත - ...................................... / ...............................................

ii. ගැටය සහිත ඇලපිල්ල - ...................................... / ...............................................

iii. කොම්බුව - ...................................... / ...............................................

iv. දීරස පා පිල්ල - ...................................... / ...............................................

v. දීර්ස ඉස්පිල්ල - ...................................... / ...............................................

(ලකුණු 10)

06. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

i. වතුර යන්නට සමාන පදය වන්නේ,

i. අබ ii. තෙත iii. අඹ iv.සඳ

ii. මධ්‍යම පුරුෂ ඒක වචනය වන්නේ මින් කුමක් ද?

i. තොපි ii. තෝ iii.නුඹලා iv. මම

iii. අලියා යන පදයේ ස්ත්‍රී ලිංග පදය කුමක් ද?

i. ඇතින්න ii. අලිදෙන iii. කෙනෙර iv. ඇතා

iv. "ඔහු"යන්න අයත් වන පුරුෂය වන්නේ,

i. උත්තම පුරුෂ ii. මධ්‍යම පුරුෂ iii. ප්‍රථම පුරුෂ iv. බහු පුරුෂ

v. අතීත කාල ක්‍රියාපදයක් නොවන්නේ,

i. කළේ ය. ii. පැසසුවේ ය. iii. ගත්තේය. iv. කරති.

07. පහත වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ආඛ්‍යාත පද වරහන් තුළින් තෝරා ලියන්න. (ලකුණු 05)

i. කුරුල්ලෝ අහසේ පියාසර ................................ (කළේ ය. / කරති.)

ii. තාපස තුමා දානයට ............................. (වැඩියා ය. / වැඩියේ ය.)

iii. අම්මා පෙහෙවස් සමාදන් ......................................... (වූහ. / වූවාය.)

iv. බල්ලා රාත්‍රියේ ......................................... (බුරති. / බිරුවේය.)

v. සුළඟට ගස් ................................................. (සෙලවෙයි. / සෙලවෙති.) (ලකුණු 04)

## ii කොටස

*ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. පන්ති කාමරයේදී ඔබ විසින් සකස් කරන ලද පොත් පිංච ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ඔබ සකස් කළ පොත් පිංචට යෙදූ නම කුමක් ද?

ii. ඔබ පොත් පිංච සැකසීමට තොරතුරු සොයා ගත් ආකාර 2 ක් ලියන්න.

iii. ඔබේපොත් පිංචේ ඇතුළත් කවි ලියූ රචකයන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

iv. පොත් පිංච සකස් කිරීමේදී ඔබට ගුරුතුමිය දුන් උපදෙස් 2 ක් ලියන්න.

v. පොත් පිංච සැකසීමේදී ඔබ මුහුණු දුන් ගැටලු 2 ක් ලියන්න.

(ලකුණු2x5=10)

02. පහත දැක්වෙන මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 150 ක පමණ රචනයක් ලියන්න.

i. මා කියවූ හොඳම පොත

ii. මම හොඳ ළමයෙක් වෙමි.

iii. ශ්‍රී ලංකාවේ වැද්දෝ

iv. මට පියාපත් ලැබුනොත්

v. මුහුදු වෙරළක අසිරිය

(ලකුණු 20)

03. ඔබේ නිවසේ පැවැත්වෙන දානමය පුණ්‍ය කර්මයකට සහභාගි වන ලෙස දන්වමින් හොඳම මිතුරාට/ මිතුරියට යවන ලිපිය ලියන්න.

නැතහොත්,

ඔබේ අත්අම්මාගේ හෝ සීයාගේ 70 වන උපන් දිනයට සුභ පැතීමට සුභ පැතුම්පතක් පිළියෙල කරන්න.

(ලකුණු 10)

04. උදැල්ල හා කැත්ත කරේ තබාලා
සැහැල්ලුවෙන් බෝම දෙපා නගාලා
දැකුම් කලුයිදැන් ගොවියා ගමන් ගත්
උදය සිරි ගේ සිරි ඉන් වැඩි වේ

i. මෙම කවියෙන් කියවෙන්නේ කවුරුන් ගැනද?

ii.”දැකුම් කලුයි” යන පදයේ අර්ථය කුමක් ද?

iii. මෙම කවිය ඇතුළත්පාඩමේ නම කුමක් ද?

iv. මෙම කවියෙහි රචකයා කවරෙක් ද?

v. මෙම කවියෙන් දවසේ කුමන කාලයක් ගැන කියවේ ද?

(ලකුණු 10)

05. පහත පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

''හොඳ හැටි තදින් ඩැහැ ගන්ට ඕනෑ''

i. මෙසේ කීවේ කවුද?

ii. මෙසේ කීවේ කාට ද?

iii. ඩැහැ ගන්ට ඕනෑ කුමක් ද?

iv. මෙම කවියෙහි රචකයා කවරෙක් ද?

v. එහි කතුවරයා කවරෙක් ද?

(ආ) ''මේක ඒකකටකටත් මදිනේ''

i. මෙසේ කීවේ කවු ද?

ii. මෙසේ කීවේ කාට ද?

iii. මදි වූයේ මොනවා ද?

iv. මෙම පාඨය ඇතුළත් පාඩම කුමක් ද?

v. මෙම පාඩමෙන් කියවෙන්නෙ කවුරුන් ගැනද?

(ලකුණු10)

රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
පළමු වාර පරීක්ෂණය - 2020
First Term Test - 2020

**සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය 01½ යි.**

**නම / අංකය : .........................................................** **6 ශ්‍රේණිය**

**I කොටස**

* **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන අර්ථය සහිත යෙදුම තෝරන්න.**

(01) නරියා උඩ බලාගෙන හයියෙන් අඬපාල ඇහුවා ඇ අපේ කාට දැකුමක් ද ඔය තඩේ ගෙනියන්නෙ කියලා.

(i) ශබ්දකර (ii) හූ කියා (iii) කෑ ගසා (iv) අත්පුඩි ගසා

(02) සුදුහ ගින්දරේ පසුවන වැද්දන්ගේ බඩට වුවමනා කරන්නේ රසයට වඩා ආහාර ප්‍රමාණය වැඩිවීමකි.

(i) බඩගින්නෙන් (ii) වේදනාවෙන් (iii) වෙහෙසවීමෙන් (iv) දැඩි උණුසුමෙන්

- **හිස්තැනට සුදුසු අක්ෂරය යොදන්න.**

(03) පුස් ...... කාලය (ත, ථ)

(04) ප්‍ර .......නය (ශ්, ෂ්)

(05) "රූපය" යන පදයේ ඇති පිල්ලම කුමක්ද?

(i) දීර්ඝ ඇදපිල්ල (ii) ඇලපිල්ල (iii) ගැටපිල්ල (iv) දීර්ඝ පාපිල්ල

- **විරුද්ධ පදය තෝරන්න.**

(06) උණුසුම

(i) උණුවීම (ii) සීතල (iii) ගින්දර (iv) ජලය

(07) "ගුවන" යන පදයට සමානාර්ථ පදයකි.

(i) නුබ (ii) රාත්‍රිය (iii) නුඹ (iv) තරු

(08) සිංහල අක්ෂර මාලාජවේ ඇති හල් කළ නොහැකි අක්ෂරයක් වන්නේ,

(i) න (ii) ඹ (iii) ට (iv) ළ

(09) සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර අක්ෂර ගණන,

(i) 10 යි. (ii) 13 යි. (iii) 18 යි. (iv) 42 යි.

(10) ප්‍රථම පුරුෂ බහු වචන නාම පදයක් වන්නේ,

(i) මම (ii) ළමයි (iii) නුඹලා (iv) අපි

- **පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

(11) ................................ පෙරහැර අලංකාර කරති. (ඇත්තු / ඇතුන්)

(12) ගස් සැමට සෙවණ ලබා ........................(දෙයි / දෙති)

(13) නුඹලා බිතු සිතුවම් .................... (නරඹන්නෙහි / නරඹන්නෙහු)

(14) .............................. උදෑසනින්ම සුබ පතමි (මම / මා)

(15) .................................. උනන්දුවෙන් විභාගය සමත් වෙමු. (අප / අපි)

- පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | උක්තය | අනුක්තය |
|---|---|---|
| (16) | ගැමියෝ | ........................................................ |
| (17) | ........................................................ | කුරුල්ලන් |
| (18) | මම | ........................................................ |
| (19) | ........................................................ | ඔවුන් |

(20) "බත් මුට්ටිය පොළොවේ ගැහුවා වගේ හිටියි." යනු,

(i) උපමාවකි. (ii) විශේෂණයකි. (iii) රූඪියකි. (iv) රූපකයකි.

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(01) සුබ පැතුම් පත් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම ඇසුරෙන් පහත් සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

I. සුබ පැතුම්පත් භාවිතා කරන අවස්ථා දෙකක් නම් කරන්න.

II. සුබ පැතුම්පතක් සකස් කිරීමේදී සැලකිය යුතු කරුණු දෙකක් නම් කරන්න.

III. සුබ පැතුම්පත නිර්මාණය සඳහා ඔබ භාවිතා කළ ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

IV. සුබ පැතුම්පත් නිර්මාණය කිරීමෙන් ඔබ ලබාගත් අත්දැකීම් දෙකක් ලියන්න.

V. සුබ පැතුම්පත් නිර්මාණය කිරීමේදී ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 2 x 5 = 10)

(02) පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

I. උදයක අසිරිය

II. වැඩිහිටියන්ට සලකමු.

III. මා ගිය අධ්‍යාපන චාරිකාව.

IV. ජලය වටිනා සම්පතකි.

V. වැසි දිනයක්.

(ලකුණු 20)

(03) ඔබ පාසලේ පැවති නිවාසාන්තර ක්‍රීඩා උත්සවය පිළිබඳව සඳහන් කරමින් වෙනත් පාසලක ඉගෙන ගන්නා ඔබගේ මිතුරෙකුට යවන ලිපියක් ලියන්න. (ලකුණු 10)

(04) පෙළ පොත ඇසුරෙන් පිළිතුරු ලියන්න.

(අ) ඉර උදා වන්නට
පළමුව නැගිට සිහිකොට
..............................................
..............................................

(I). කවිය සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02)

(II). එම කවිය ඇතුළත් කාව්‍ය කෘතිය කුමක්ද? (ලකුණු 01)

(III). එම කාව්‍ය කෘතියේ රචකයා නම් කරන්න. (ලකුණු 01)

(IV). එම කවියෙන් කියවෙන යහපත් පුරුද්දක් ලියන්න. (ලකුණු 01)

(ආ) "දුකට පත් වුණ වෙලාවක පිහිටක් ඉල්ලන යාළුවකුට හිනාවීම ඒ තරම් වැදගත් කාරියක් නෙමෙයි."

(I). මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක්ද? (ලකුණු 01)

(II). එය කාවිසින් කාහට කියන ලද්දක්ද? (ලකුණු 02)

(III). කුමන අවස්ථාවක කියන ලද්දක්ද? (ලකුණු 02)

(05) "කියවන්නෝ දිනන්නෝ" වැඩසටහනට අයත් අතිරේක පොත් කියවීමට අදාළ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න.

1)

I. "මුහුද අද්දර ගෙදර ළමයි" යන කෘතියේ කතුවරයා නම් කරන්න. (ලකුණු 03)

"ඇයි ........ අපි ලොකු බෝට්ටුවක නැගලා ගංඟාව දිගේ උඩහටත් ගියා ඔයාලට මතක නැද්ද"

II. ඉහත ප්‍රකාශය කළේ කවුරුන්ද? (ලකුණු 01)

III. එය අසා සිටියේ කවුරුන්ද? (ලකුණු 01)

2)

I. අපේ ගමේ විත්ති යන කෘතියේ රචකයා නම් කරන්න. (ලකුණු 02)

"අපි කණමැදිරියෝ අල්ලමු."

II. ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවුරුන්ද? (ලකුණු 01)

III. කාහට ද? (ලකුණු 01)

IV. එම ප්‍රකාශය අයත් කතාවේ නම කුමක්ද? (ලකුණු 01)

3)

I. "තැනිතලාවේ පිහිටි කුඩා නිවස" කෘතියේ පරිවර්තකයා නම් කරන්න. (ලකුණු 03)

"අපි දවසක් දෙකක් මෙහෙ ඉඳිමු."

II. ඉහත ප්‍රකාශය කළේ කවුරුන්ද? (ලකුණු 01)

III. කාහටද? (ලකුණු 01)

4) Peter and the Wolf

I. මෙම කතාවේ කියවෙන සිද්ධිය කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

II. එම කතාවේ එන චරිත තුන නම් කරන්න. (ලකුණු 05)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Provincial Education - NWP

| 6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 21 S |
|---|---|---|
| නම ............................................ | සිංහල භාෂාව හා සාහිත්‍යය - I කොටස | කාලය පැය දෙකයි |

**උපදෙස් :**
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

**★ අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයට සමාන අර්ථය දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) <u>වෘක්ෂලතා</u> පරිසරය අංලකාර කරයි.

(1) කඳුවැටි (2) ඇළ දොළ (3) ගස් වැල් (4) දිය දහරා

(2) ඇය <u>උඩඟු</u> කාන්තාවක් වූවාය.

(1) අහංකාර (2) නිහඬ (3) අවංක (4) කාරුණික

(3) <u>විකසිත</u> පුෂ්පයෝ සුවඳ විහිදුවති.

(1) පරවුණු (2) මැලවුණු (3) මුකුලිත (4) පිපුණු

**★ අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල දී ඇති පදයට විරුද්ධ පදය ලියන්න.**

(4) නිශ්චල - .........................

(5) පළල - .........................

(6) දොම්නස - .....................

**★ අංක 07 සහ 08 ප්‍රශ්නවල පිල්ලම් පිළිවෙළට නිවැරදිව යොදා ඇති වචනය යටින් ඉරක් අඳින්න.**

(7) ගැටපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල.

(1) ගෘහය (2) කුඹියා (3) කෘමියා (4) භූමිය

(8) ඇලපිල්ල, හල් ලකුණ, ගැටපිලි දෙක, හල් ලකුණ

(1) කර්තෘ (2) ශාස්තෘන් (3) කෘතිම (4) කෛලාස

**★ අංක 09 සහ 10 ප්‍රශ්න යටතේ දී ඇති වචනයන් හි ස්වර හා ව්‍යංජන අක්ෂර වෙන්කර දක්වන්න.**

(9) කෞතුකාගාරය - ....................................

(10) රසිකයා - ....................................

**★ අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි උක්ත පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) ..................................... පාසල් වත්ත පිරිසිදු කළහ.

(1) සිසුන් (2) ශිෂ්‍යයන් (3) සිසුවෙක් (4) සිසුහු

(12) .................................... මිහිරි ගීයක් ගයන්නීය.

(1) දැරියෝ (2) දැරියන් (3) දැරියක් (4) දැරියක

(13) ................................... මිරිස් පාත්තියේ වල්පැළ ගලවා දැමුවේය.

(1) ගෙවිලිය (2) ගොවියා (3) ගොවියෙකු (4) ගෙවිලියක

* **අංක 14 සිට 15 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ ඒකවචන පදය තිත් ඉර මත ලියන්න.**

(14) <u>මිනිස්සු</u> ශබ්දය කුමක්දැයි විමසා බැලූහ. ...............................................

(15) <u>නාවිකයෝ</u> සාර්ථකව මුහුදු ගමන් නිමා කරති. ...................................

* **අංක 16 සහ 17 ප්‍රශ්නවල ඉරිඇඳි පදය අයත් පුරුෂය ලියන්න.**

(16) <u>ගුරුවරු</u> කාර්යාලයට පැමිණෙති. ................................

(17) <u>මම</u> පන්තියට ගියෙමි. .............................

* **අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අනුක්ත පදය ලියන්න.**

(18) <u>අපි</u> සතුටින් නාට්‍ය බැලුවෙමු. ...........................

(19) <u>කම්කරුවෝ</u> මාර්ගය පිරිසිදු කරති. .........................

(20) <u>ළමයා</u> මල් පැළ සිටුවයි. .............................

(ලකුණු 2x20=40)

II කොටස

* **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 ට නො අඩු රචනයක් ලියන්න.

(අ) පරිසරය ආරක්ෂා කරමු.
(ආ) මුහුදු වෙරළක සැඳෑවක්.
(ඉ) අපේ රටේ සුන්දරත්වය සුරකිමු.
(ඊ) වැඩිහිටි ඔවදන් පිළිපදිමු. (ලකුණු 20)

(02) ඔබ ගිය විනෝද චාරිකාවක් පිළිබඳ විස්තර කරමින් ඔබේ මිතුරෙකුට හෝ මිතුරියකට යවන ලිපියක් ලියන්න.

**නැතහොත්**

ඔබේ හොඳම මිතුරාගේ උපන්දිනයට සුබ පතමින් යවන සුබ පැතුම්පත නිර්මාණය කරන්න.

(ලකුණු 10)

(03) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සාමාන්‍ය වශයෙන් කොස් ගෙඩිය ඉදෙන්නට ප්‍රථම ගෙඩිය නෙළාගනු ලැබේ. ගෙඩියේ පැසුණු නොපැසුණු බව දැන ගනු ලබන්නේ එහි පිටතින් සියුම් සිදුරක් කොට මදුලු කැබැල්ලක් හෝ ගෙන බලාය. කොස් ගෙඩි පලු කොට කපා මදුලු වෙන් කොට ගෙන තම්බා බත් වෙනුවට කුස පුරා අනුභව කරති. ඔවුන් කොස් කන්නේ අපේ රටවාසින් 'ටර්නිප්' හෝ ගෝවා කන්නාක් මෙනි. මේ කොස් තැම්බුම රසයෙන් ද සුවඳින් ද ගෝවාවලට සමානය. පැසී ඉදුණු කල හෙවත් වැළ හෝ වරකා වූ කල සුමධුර රසයකින් යුක්ත වූ මෙය නොපිස ම කනු ලැබේ. පැසුණු කොස් ඇට පාටින් හා සුවඳින් පමණක් නොව, රසයෙන් ද අපේ රටේ 'චෙස්නට්' ගෙඩිවලට සමාන ය.

(i) කොස් ගෙඩිය නෙළා ගනු ලබන්නේ කෙසේ ද?

(ii) කොස් ගෙඩිය පැසුණු නොපැසුණු බව දැන ගන්නේ කෙසේ ද?

(iii) බත් වෙනුවට ආදේශක ආහාරය කුමක් ද?

(iv) නොපිසම කෑමට ගන්නේ මොනවා ද?

(v) චෙස්නට් ගෙඩිවලට සමාන මොනවා ද? (ලකුණු 2×5 = 10)

(04) පහත සඳහන් ප්‍රකාශ කළේ කවුද කාටද යන්න ලියන්න.

(I) "මගේ ඉල්ලීම ගැන හිතා බැලීමයි යුතුකම"

(ii) "එහෙනම් ගිහින් හොයාගෙන වරෙල්ලා"

(iii) "ගොහින් බලාපල්ලා මගේ වී ගොඩ"

✶ **පහත කවි දෙක කියවා හිස්තැනට නියමිත කවිපදය ලියන්න.**

(iv) සමන් නෙළුම් හා මහනෙල් ද රෝස
මලින් නැගී ආ සුවඳින් උරා බී
හමන්නෙ මේ සීත සුළං අලුත් වූ
..............................................................

(v) ..............................................................
තමන්ට බුහුමන් ලැබෙයි එයින්නේ
අනුන්ට තම වංශය කියමින්නේ
ලබන්ට නම්බුව නොසිතාපන්නේ (ලකුණු 2x5=10)

(05) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(I) හල් කළ නොහැකි ව්‍යඤ්ජන අක්ෂර දෙකක් ලියන්න

(ii) සිංහල අක්ෂරමාලාවෙහි ඇති අක්ෂර ගණන කීය ද?

(iii) 'නරි නයිදේ රුවටිච්චි' පාඩම උපුටා ගන්නා ලද ග්‍රන්ථය කුමක් ද?

(iv) 'මැකී ගිය දඩමං' කෘතියේ පරිවර්ථකයාගේ නම ලියන්න.

(v) 'අපේ ගම' කෘතියේ රචකයා කවු ද?

(vi) සචේතනික නාමපද හතරක් ලියන්න.

(vii) අචේතනික නාමපද හතරක් ලියන්න.

✶ **පහත දැක්වෙන නාම පද පුරුෂලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග වශයෙන් වගුගත කරන්න.**

(මයිනා, වහලය, මැහැල්ල , කමත , වැළහින්න , කොකා , නදිය , ගෙවිලිය , විදුහල්පති )

| | පුරුෂලිංග | ස්ත්‍රී ලිංග | නපුංසක ලිංග |
|---|---|---|---|
| (viii) | | | |
| (ix) | | | |
| (x) | | | |

(ලකුණු 1x10=10)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**පළමු වාර ඇගයීම**
**முதலாம் தவணைமதிப்பீடு - 2018**
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | පැය / மணித்தியாலம் / Hours: 02 |

**සැලකිය යුතුයි**

- **පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. 1,11 පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.**

---

1) අනුපිළිවෙළින් ස්වර දක්වා ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
   1. අ,ආ,ඉ,ඍ,උ
   2. ඔ,ඕ,ඖ.එ, ඓ
   3. උ,සa,සaa, එ,ඒ
   4. ඇ,ඉ,ඍ,උ,ඌ

2) 'උදැල්ල' යන වචනයෙහි ස්වර හා ව්‍යඤ්ජන වෙන් කළ විට නිවැරදි පිළිතුර වන්නේ,
   1. අ+උ+ද්+ඇ+ල්+අ
   2. උ+ඇ+ද්+අ+ල්+අ
   3. උ+ද්+ඇ+ල්+ල්+අ
   4. උ+ද්+අ+ල්+ල්+අ

- 3 හා 4 ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශන අතුරින් අක්ෂරමාලාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

3) 1. අක්ෂරමාලාව කොටස් තුනකට බෙදේ.
   2. ස්වර සංඛ්‍යාව 18 කි.
   3. වචනයක මුල් ශබ්දය ස්වරයක් වූ විට පිළි යෙදිය යුතුම ය.
   4. වචනයක මැද ස්වර යෙදීමට හැකියාවක් නැත.

4) 1. ව්‍යඤ්ජන තනිව උච්චාරණය කළ හැකි ය.
   2. සෑම ව්‍යඤ්ජනාක්ෂරයක් ම හල් කළ හැකි ය.
   3. ස්වර අක්ෂර නොයෙදෙන වචන භාෂාවේ භාවිත වේ.
   4. අක්ෂරමාලාවේ ඇති ස්වර අකුරු හැර සෙසු අකුරු සියල්ල ව්‍යඤ්ජන අක්ෂර වේ.

5) රූපය, රබාන, මාපිය, යන වචනවල ඉරි ඇඳි අකුරේ යෙදී ඇති පිල්ලමේ නාමය පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.
   1. ඉස්පිල්ල, දිගු පාපිල්ල, ඇලපිල්ල
   2. දිගු පාපිල්ල,ඇලපිල්ල, ඉස්පිල්ල
   3. ඇලපිල්ල, ඉස්පිල්ල,දිගු පාපිල්ල
   4. ඇලපිල්ල, දිගු පාපිල්ල, ඉස්පිල්ල

6) පහත සඳහන් ස්වර අතුරින් පිල්ලමකින් සංකේතවත් නොවන ස්වරය වන්නේ,
   1. උ  2. අ  3. ඉ  4. ඔ

- 7 හා 8 ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට සමානාර්ථ දෙන වචන තෝරන්න.
  7) ඉඩෝරය; 1. කාන්තාරය 2. නියඟය 3. නාය යෑම 4. භූ චලනය
  8) සුදඟ ගින්න; 1. ළැව් ගින්න 2.සුදු පැහැ ගින්න 3.කුසගින්න 4.කුඩා ගින්න

- 9 හා 10 ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට විරුද්ධාර්ථය දෙන වචන තෝරන්න.
  9) නිශ්චල; 1.නොසැලෙන 2. පැතිරෙන 3.සෙලවෙන 4. එළඹෙන
  10) දිළිඳු ; 1.හිතවත් 2.දුප්පත් 3. බලවත් 4.ධනවත්

11) නාම පද වර්ගීකරණය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,
   1. වචන භේදය පදනම් කරගෙන නාම පද වර්ගීකරණය කෙරේ.
   2. උක්ත අනුක්ත භේදය පදනම් කරගෙන නාම පද වර්ගීකරණය කෙරේ.
   3. ලිංග භේදය පදනම් කරගෙන නාම පද වර්ගීකරණය කෙරේ.
   4. කාල භේදය පදනම් කරගෙන නාම පද වර්ගීකරණය කෙරේ.

12) පහත දී ඇති පද අතුරින් උක්ත නාම පදය තෝරන්න.
   1. තොප 2.මා 3.තොපි 4. ළමයින්

13) පහත දී ඇති පද අතුරින් අනුක්ත නාම පදය තෝරන්න.
   1. මිනිස්සු 2.ඔවුන් 3.අපි 4.හෙදියෝ

14) පහත නාම පද අතුරින් අචේතනික නාම පදය තෝරන්න.
   1. ගිරවා 2.බැළලිය 3. රාස්සි 4. නිවස

15) පහත නාම පද අතුරින් ප්‍රථම පුරුෂ ඒක වචන නාම පදය තෝරන්න.
   1. මම 2. නුඹලා 3. මිනිසා 4. අපි

16) පෙළ පොතේ පාඩම් අතුරින් සොබා දහමේ ආශ්චර්යයෙන් මිනිස් ජීවිත ප්‍රබෝධවත් වන ආකාරය පැවසෙන පාඩමක් වන්නේ,

   1. නරි නයිදේ රැවටිච්චී 2. උදය සිරි
   3. අපි කවි ලියමු 4. සිරිත් හොඳ දැනගෙන

17) 'චිවෙං චුලංගෙං යමු කිරි නැනෝ' පාඩමෙහි සඳහන් වන පරිදි කුඩමසුන් අල්ලා ගැනීමට වැද්දන් යෙදූ උපක්‍රමයක් නොවන්නේ,
   1. පුස්වැල් කැබලි තළා දියට දැමීම
   2. කුකුරුමුවන් ගෙඩි තළා දියට දැමීම
   3. කුඹුක් ඇට තළා දියට දැමීම
   4. දළුක් කිරි එකතු කර දියට දැමීම

18) පහත දැක්වෙන පද්‍ය කොටසේ ඉරි ඇඳි පදයට නොගැළපෙන අර්ථයක් දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

"එක ම වැඩක <u>නිතර ම</u> නොයෙදෙන්නේ
වෙන ම වෙන ම වැඩ සලකා ගන්නේ

1. නිරන්තරයෙන් 2. සතතයෙන් 3.අනවරතයෙන් 4. අතරතුර

- 19 හා 20 යන ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

19) ------------------- පෙරහැර අලංකාර කරයි.

1. ඇතුන් 2. ඇතා 3. ඇතෙකු 4.ඇත්තු

20) ---------------- ශිෂ්‍යයන් අගය කරති.

1. ගුරුවරයා 2. ගුරුවරුන් 3.ගුරුවරිය 4. ගුරුවරු (ලකුණු 2 x 20= 40)

## <u>11 කොටස</u>

**1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. 3,4,5,6,7 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

1) ඔබ පන්ති කාමරයේ දී සකස් කළ පොත් පිංච ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
   - i. පොත් පිංචට යෙදූ නම කුමක් ද? (ලකුණු 02)
   - ii. එම පොත් පිංච සකස් කිරීමේ දී ඔබට පැවරුණු කාර්යය කුමක් ද? (ලකුණු 02)
   - iii. පොත් පිංච සඳහා ඇතුළත් කළ ලිපි **දෙකක** මාතෘකා සඳහන් කරන්න. (ලකුණු 04)
   - iv. ඒ සඳහා තොරතුරු ලබා ගත් මූලාශ්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
   - v. මෙබඳු නිර්මාණයක් කිරීමෙන් ඔබට අත්වන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

2) පහත දැක්වෙන මාතෘකා අතරින් **එකක්** තෝරා ගෙන **වචන 125 කට** නො අඩු වන සේ රචනයක් ලියන්න.
   - I. යහ-ගුණදම් වඩමු උතුම්
   - II. සුන්දර පාන්දර
   - III. ආදි වාසියෙකු දවස ගෙවන හැටි
   - IV. මා දුටු පුරාණ පුදබිම

(ලකුණු 14)

3) ඔබ පසුගිය දිනෙක සීගිරියේ අධ්‍යාපන චාරිකාවක යෙදුනේ යැයි සිතා එහි දී ඔබ දුටු දේ, හමු වූ අය,විනෝද වූ අයුරු,උගත් දේ යනාදි තොරතුරු ඇතුළත් කොට විදේශ ගතව සිටින ඔබේ මවට ලිපියක් ලියන්න. (ලකුණු 10)

4) පහත සඳහන් පාඨ උපුටා ගත් ග්‍රන්ථ නාම හා කතුවරුන් ලියා වගුව සම්පූර්ණ කරන්න.

| පාඨය | උපුටා ගත් ග්‍රන්ථයේ නම | කතුවරයා |
|---|---|---|
| 1 " හා ,හා, මම එහෙමත් කරනව ද?" | ............................ | ........................... |
| 2 " මහවනය රාත්‍රී කාලයේ ශාන්ත හෝ නිශ්චල හෝ නොවේ' | . ........................... | . ........................... |
| 3 "ඔහු බිම සදාලා ගෙදර ඇවිත් වැපිරීමට වී ඉල්ලුවේ ය. | ........................... | ............................ |
| 4 "අනුන්ට බුහුමන් දී සලකන්නේ" | . ........................... | ............................ |
| 5 "එතැන් සිට රෑ ගතවන තුරු උඳුනෙන් නගින ගින්න නොනිවේ." | ........................... | ............................ |

(ලකුණු 10 )

5) පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට කරන ලද්දේ දැයි ලියා වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | කවුරුන් විසින් ද? | කාහටද? |
|---|---|---|
| 1" අනේ යන තැනකට මාත් කැටුව යන්ට." | ...................................... | . ......................... |
| 2 " එහෙනම් ගිහින් හොයා ගෙන වරෙල්ලා " | ...................................... | ......................... |
| 3 "ඒකත් හරි තමා " | .................................... | ........................... |
| 4 "ඔහු ගැන මම චංචලව සිටිමි. " | ...................................... | ............................. |
| 5 " අපූරු අමුතු දෙයක් සොයා ගත්තොත් නුඹට මුළු කැලේ පුරාම කියව කියවා ඇවිදිතැකි" . | ..................................... | ................................. |

(ලකුණු 2 x 5= 10)

6) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ක්‍රිකට් ක්‍රීඩාවේ උපත සිදු වූයේ එංගලන්තයේ ය. 13 වන සියවසේ මැද භාගයේ දී ක්‍රිකට් ක්‍රීඩාව එංගලන්තයේ ඇරඹුණු බවට සාක්ෂ්‍ය කලාකරුවන් විසින් අඳින ලද සිතුවම් මගින් ලැබී ඇත.ශීත රටක් බැවින්, තම ශරීරයේ උෂ්ණත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රයෝජනවත් වේ යැයි සිතූ ඉංග්‍රීසි ජාතිහු ක්‍රමයෙන් ක්‍රිකට් ක්‍රීඩාව තම ප්‍රාන්ත අතර ජනප්‍රිය කළහ. 1968 දී සාන්ත ඇල්බන්ස් ක්‍රිකට් සමාජය බිහිවුණු බවත් ඉන් අනතුරුව, ක්‍රමයෙන් ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රචලිත වුණු බවත් ඉතිහාසයේ සටහන් වේ. 18 වන සියවස ඇරඹෙත් ම ක්‍රිකට් ක්‍රීඩාව, ක්‍රමවත් නීතිරීති පද්ධතියක් යටතේ පවත්වන්නට කටයුතු සැලසිණි.වාර්තාගත ප්‍රථම ක්‍රිකට් තරගය 1697 දී සසෙක්ස්හි දී පැවති බවත්, මේ තරගයට එක් පිළකට එකොළොස් දෙනා බැගින් සහභාගි වුණු බවත්, මෙම තරගය ගිණි පනහක ඔට්ටුවක් සඳහා දෙපිළ අතර පැවති බවත් සඳහන් වේ.

i. ක්රිකට් ක්‍රීඩාවේ උපත සිදු වූ රට හා ක්‍රිකට් ක්‍රීඩාව ආරම්භ වූ කාල වකවානුව සඳහන් කරන්න.
ii. ඉංග්‍රීසි ජාතිකයන්හට ක්‍රිකට් ක්‍රීඩාවෙන් අත් වූ ප්‍රයෝජනය කුමක් ද?
iii. ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් 18 වන සියවසෙහි ආරම්භය වැදගත් වන්නේ ඇයි?
iv. ප්‍රථම ක්‍රිකට් තරගය පැවැත් වූ ස්ථානය නම් කරන්න.
v. බිහිවුණු, ප්‍රචලිත යන වචනවල අර්ථ ලියන්න.

(ලකුණු 2 x 5= 10)

7) පහත පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ටින් කබලකට කෝටුවකට සටන් කොට
තොල් පෙරළමින් කඳුළෙන් ඉදිරියෙන් සිට
එන විට කුඩා දරුවා නඩු කියන්නට
සිප සනසවනු හැක කවියකු ලෙසින් මට

බැනියම ඉරී තිබුණොත් එය ඇඟිලි කොනින්
කොනහා එතැන ලොකු කරවන අසුර සැනින්
පොඩි දඟකාරයන් රෑනක් ලැබුව පිනින්
මම සැප විඳිමි අන් සැපතක් කුමට වෙනින්

i. පළමු පද්‍යයට අනුව කුඩා දරුවා සටන් කළේ ඇයි?
ii. ඔහු නඩු කියන්නට පැමිණියේ කවර ආකාරයකින් ද?
iii. කවියා එම නඩු විසඳුවේ කෙසේ ද?
iv. දෙවන පද්‍යයෙන් විස්තර වන දඟ වැඩය කුමක් ද?
v. “ සටන් කොට” “අසුර සැනින්” යන වචන සඳහා අර්ථ ලියන්න.

( ලකුණු 2 x 5 = 10 )

# පිළිතුරු



**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Provincial Education - NWP

6 ශ්‍රේණිය | පිළිතුරු පත්‍රය | පළමු වාර පරීක්ෂණය - 2019 | 21 S

(1) 3 (2) 1 (3) 4 (4) චංචල / සසල (5) දිග / පටු
(6) සොම්නස (7) කෘමියා (8) ශාස්තෘන්
(9) ක් +ඖ + ත් + උ +ක් +ආ +ග් +ආ +ර් +අ +ය් +අ
(10) ර් +අ +ස් +ඉ + ක් + අ + ය් + ආ (11) 4 (12) 3 (13) 2
(14) මිනිසා (15) නාවිකයා (16) ප්‍රථම පුරුෂ (17) උත්තම පුරුෂ
(18) අප (19) කම්කරුවන් (20) ළමයා

(ලකුණු 2 x 20 = 40)

II කොටස

(01) කරුණු සඳහා (ලකුණු 7)
සාරවත් බව , නිර්මාණාත්මක බව , සංවිධානාත්මක බව (ලකුණු 10)
ශිල්පීය දක්ෂතා භාවිතය (ලකුණු 3)
මුලු ලකුණු 20 ලෙස ලකුණු පිරිනමන්න.

(02) ආකෘතියට (ලකුණු 3)
කරුණු වලට (ලකුණු 5)
ශිල්පීය දක්ෂතා (ලකුණු 2)
මුලු ලකුණු 10 ලෙස පිළිතුර සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න.

(03) (I) ඉදෙන්නට ප්‍රථමව / ඉදෙන්න කලින්
(II) කොස් ගෙඩිය පිටතින් සියුම් සිදුරක් කපා මඳුලු හෝ ඇට කැබැල්ලක් ගෙන බලා
(III) තම්බපු කොස් / කොස් තම්බලා / පලු කොට කපා මඳුලු වෙන් කොට ගෙන තම්බා
(IV) වැළ , වරකා / ඉදුණු කොස්
(V) පැසුණු කොස් ඇට

(ලකුණු 2 x 5 =10)

(04) (I) ඉබ්බා , මානකොක්කුන්ට
(II) පොරමොලා , ගමා හා කයිරා ට / කොල්ලො දෙන්නට
(III) මුවන්තිස්ස කුමාරයා සහෝදරයින්ට
(IV) පණක් දීදී මෙන් මට මේ වෙලාවේ
(V) අනුන්ට බුහුමන් දී සලකන්නේ

(ලකුණු 2 x 5=10)

(05) (I) ග , ජ, ඩ , ඳ , ඹ , (අ)ං , (අ)ඃ ,ළ
(II) 60 කි
(III) වටු කිරිල්ලී සහ තවත් කථා
(IV) ඒ.පී ගුණරත්න
(V) මාර්ටින් වික්‍රමසිංහ මහතා
(VI) නිවැරදි පිළිතුර සඳහා ලකුණු පිරිනමන්න
(VII) නිවැරදි පිළිතුර සඳහා ලකුණු පිරිනමන්න

| | පුරුෂලිංග | ස්ත්‍රීලිංග | නපුංසකලිංග |
|---|---|---|---|
| (VIII) | මයිනා | මැහැල්ල | වහලය |
| (IX) | කොකා | වැළහින්න | කමත |
| (X) | විදුහල්පති | ගෙවිලිය | නදිය |

පුරුෂලිංග පද 03 සඳහා ලකුණු 1 යි. නපුංසකලිංග පද 3 සඳහා ලකුණු 1 යි. ස්ත්‍රීලිංග පද 3 සඳහා ලකුණු 1

(ලකුණු 1 x 10=10)

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ